**කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය- 2013**

**-----------------------------------------------**

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ආසියානු සංවර්ධන බැංකුව(ආසබැ) හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර 2007 අප්‍රේල් 25 දින එළඹි අංක 2319 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**---------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව මහා මාර්ග , වරාය හා නාවික අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, කලාපීය නැව් බඩු හුවමාරු කේන්ද්‍රීය වරායක් ලෙස එහි තත්ත්වය පවත්වා ගැනීම සඳහා පොදු හා පුද්ගලික හවුල්කරු ලෙස එය යොදා ගැනීම මඟින් තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම තුළින් ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමය. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 46,715.68 කට සමාන එජඩො මිලියන 424.8 ක් වන අතර එයින් රු.මිලියන 32,991.3 කට සමාන එජඩො මිලියන 300 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. තවද රු.මිලියන 5,465.56 කට සමාන එජඩො මිලියන 49.7 ක් හා රු.මිලියන 8,258.82 කට සමාන එජඩො මිලියන 75.1 ක් මූල්‍යායනය කිරීමට පිළිවෙලින් ශ්‍රී ලංකා රජය හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 අප්‍රේල් 11 දින ආරම්භ කරන ලද අතර, 2012 අප්‍රේල් වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, ආසියානු සංවර්ධන බැංකුව විසින් 2011 මැයි 03 දිනැති ලිපිය මඟින් ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2013 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කර තිබුණි.
වියදම පහත පරිදි ව්‍යාපෘති සංරචකයන් අතර බෙදාහැර තිබුණි.

| **ව්‍යාපෘති සංරචකය** | **මුදල** | |
|---|---|---|
| | **එජඩො මිලියන** | **රු.මිලියන** |
| ප්‍රාථමික වැඩ පිළිබඳ පිරිවැය | 318.5 | 35,025.76 |
| අධීක්ෂණ හා ඉදිකිරීමේ පිරිවැය | 12.7 | 1,396.63 |
| බදු හා ගාස්තු | 49.7 | 5,465.56 |
| අසම්භාව්‍යයන් | 43.9 | 4,827.73 |
| | 424.8 | 46,715.68 |

සටහන : 2007 අප්‍රේල් 25 දිනට විනිමය අනුපාතය : එජඩො 1 = රු.109.9710

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් , අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---------------------------------------------------

මාගේ විගණන පරික්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු , වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් හා ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වී තිබුණේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

**-----------------------**

මූල්‍ය ප්‍රකාශනවලට හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.මිලියන 1,980 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 44,035 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| වැඩ | 1,772 | 7,690 | 40,057 |
| උපදේශක සේවා | 38 | 185 | 1,031 |
| බදු, රේගු බදු | 9 | 214 | 1,618 |
| මූල්‍ය ගාස්තු හා ව්‍යාපෘති පරිපාලනය | 161 | 352 | 1,329 |
| | 1,980 | 8,441 | 44,035 |

**5.** **විගණන නිරීක්ෂණ**

--------------------

**5.1** **නොසැසඳූ ශේෂ**

------------------

රේඛීය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම අනුව, බදු හා රේගු ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ රු.46,606,303 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබුණු අතර, ව්‍යාපෘති ගිණුම අනුව, එය රු.8,306,093 ක් ලෙස දක්වා තිබුණි.

**6.** **අරමුදල් උපයෝජනය**

----------------------

අරමුදල් මූලායනය හා සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රතිපාදනය සඳහා එකඟවූ මුදල | | වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 300.0 | 32,991.3 | 1,810 | 3,000 | 33,748 |
| ශ්‍රීලංර | 49.7 | 5,465.5 | 9 | 12.7 | 1,618 |
| ශ්‍රීලංවඅ | 75.1 | 8,258.8 | 161 | 68.2 | 8,669 |
| | 424.8 | 46,715.6 | 1,930 | 380.9 | 44,035 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය උපදේශක සමාගම සමඟ අත්සන් කරන ලද ගිවිසුමේ ඇමුණුම "ඊ" අනුව, රු.268,072,500 ක් වූ දේශීය වැටුප් සහ උපදේශක සමාගමේ විදේශීය කාර්ය මණ්ඩලය සඳහා මාස 164 ක් සඳහා නවාතැන් වියදම් රු.45,100,000 ක් ව්‍යාපෘතිය විසින් දැරීමට එකඟවී තිබුණි. කෙසේ වුවද දේශීය වැටුප් සහ 2012 දෙසැම්බර් දක්වා උපදේශකයන්ගේ නවාතැන් ගාස්තු සඳහා තථ්‍ය වියදම පිළිවෙලින් රු.321,591,619 ක් හා රු.48,867,204 ක් වූ අතර ඒ අනුව මුළු වියදම රු.55,776,447 කින් ඉක්මවා තිබුණි.

(ආ) ව්‍යාපෘතිය ආරම්භයේ සිට ව්‍යාපෘතිය විසින් දරන ලද විදේශ ගනුදෙනු පිළිබඳ විනිමය පාඩුව රු.මිලියන 2,616 ක් විය.

(ඇ) කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2010 ඔක්තෝබර් 31 දින නිම කිරීමට සැලසුම් කර තිබුණද, ව්‍යාපෘතියේ කාල පරිච්ඡේදය 2013 අප්‍රේල් 30 දක්වා දෙවතාවක් දීර්ඝ කර තිබුණි. තවද උපයෝජනය නොකරන ලද අරමුදල්වලින් සියයට 1.2 ක් නියෝජනය වන රු.110,781,114 ක් වූ බැඳීම් ගාස්තු ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

**7.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) කොන්ත්‍රාත්කරුගේ හා උපදේශකගේ රේගු බදු හා උපයන විට ගෙවීම් බදු ප්‍රතිපූර්ණය කිරීම.